ශීර්ෂය 193 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 193 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2022 චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිත කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කල යුතු බවට උපදෙස් දී තිබුණද ආයතනය විසින් එම වගන්තියට පටහැනිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 දරණ චක්‍රලේඛයේ 6 ඡේදයේ (ACA-සී) ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිය යුතු වුවත් මුදල් සටහන් පමණක් භාවිතා කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. | රු.67,603,030 ක වටිනාකම කම්කරු අංශය, වන්දි කොමසාරිස්, ඵලදායීතා හා විදේශ රැකියා යන අංශවල එකතුව වේ. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රවාහන උපකරණ හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වල ශේෂය පිළිවෙලින් රු. 416,645,328 ක් හා රු. 216,603,735 ක් වූ අතර 2022 ජනවාරි 01 දින ආරම්භක ශේෂය ලෙස ගැනීමේදී එය පිළිවෙලින් රු.624,941,134 ක් හා රු.253,022,479 ක් ලෙස ගෙන තිබුණි. මෙම වෙනසට හේතුව ගිණුම් සටහනක් මගින් හෝ අනාවරණය කර නොතිබුණි. | 2022 වර්ෂය තුලදී පවරාගත් විදේශ රැකියා අංශයෙහි 2022.01.01 දිනට පැවති ජංගම නොවන වත්කම්වල වටිනාකම 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ACA-6 ආකෘතියේ ආරම්භක ශේෂයට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. | ගිණුම්වල පැවති වෙනස්කම් සටහන් මගින් අනාවරණය කළ යුතුය. |

#### (ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් පිළිවෙලින් රු.45,546,282 ක් හා රු.46,125,155 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වාර්තා අනුව එය පිළිවෙලින් රු.46,120,398 ක් හා රු.111,714,067 ක් ලෙස දැක්වුණි. | 193-11 හා 12 මගින් සිදුකල කාල පරිච්ඡේදයේ හර හා බැර කිරීම්වලට අමතරව විදේශ රැකියා අංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය මෙම අමාත්‍යාංශයට පැවරීමේදී තිබූ ශේෂයන්ද ඇතුලත්ව භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල වටිනාකම ගොඩනැගී තිබීමයි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුය. |

### (ඇ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 චක්‍රලේඛයේ 7.10 මාර්ගෝපදේශය ප්‍රකාරව අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශන සමඟ අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ ඇතුලත් දත්ත අතර නොසැසඳුන අවස්ථා විය. | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන අනුව දැක්වෙන ශේෂයන්ගේ ඇතුලත් වනුයේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කම්කරු අංශය, එලදායීතා ලේකම් කාර්යාලය හා වන්දි කොමසාරිස් කාර්යාලය වර්ෂය පුරාවටම සිදුකල ගණුදෙනු හා විදේශ රැකියා අංශය සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ කාලයට පමණක් වූ ගණුදෙනු වීමත්, අග්රිම සැසඳුම් ප්‍රකාශය ACA – 7 හි දැක්වෙනුයේ ඉහත සියලුම ආයතනවල වර්ෂය පුරාවටම සිදුකල ගණුදෙනු වීමත්ය. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ii) | කම්කරු අමාත්‍යාංශය මගින් විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමෙහි වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.951,492,000 ඇතුලත් කර නොතිබුණු අතර අංක 249/22 අග්‍රිම ගිණුමේ ලැබීම් හා ගෙවීම් අතර රු.951,592,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම රු.951,492,000 (ACA-3) හා විදේශ රැකියා අංශය මෙම අමාත්‍යාංශයට පැවරීමේදී මාරු කළ රු.100,000 ක මුදලින් විගණනයෙන් වෙනසක් පවතිනවා යැයි කියනු ලබන වටිනාකම වන රු.951,592,000 ක වටිනාකම ගොඩනැගී ඇති බවට අනුමාන කරනු ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව ගිණුම් පිළියෙල කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 26 කට අදාලව සලසා තිබූ රු.6,240,000 ක් වූ අයවැය ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබීමෙන් සියයට 100 ක ඉතිරියක් නිරීක්ෂණය විය. | රාජ්‍ය අමාත්‍යතුමාට පුනරාවර්ථන වැය සඳහා 193-1-1 ව්‍යාපෘතිය ප්‍රතිපාදන ලබාදීම, අපේක්ෂිත වියදම් පැන නොනැගීම, වියදම් කළමණාකරණය මත ප්‍රතිපාදන ඉතිරිවිය. | ප්‍රතිපාදන කාර්යක්ෂමව වැය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයන් 20 කට අදාලව සලසා තිබූ රු.62,600,000 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.22,717,543 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මෙම වැය විෂයයන්ගේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 50 සිට සියයට 94 දක්වා පරාසයක් තුල පැවතුණි. | අමාත්‍යාංශ දෙක ඒකාබද්ධ වීම, මෙහෙවර පියෙස අභ්‍යන්තර කාමර වෙන් කිරීම ප්‍රමාද වීම, වියදම් කළමණාකරණය නිසා ඉතිරිවිය. | ප්‍රතිපාදන මනාලෙස කළමනාකරණය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 04 ක් සඳහා වූ ඇස්තමේන්තු අගය රු.1,900,000 සිට රු.7,409,750 ක් දක්වා එනම් සියයට 152 සිට සියයට 548 ක් දක්වා ප්‍රමාණයකින් පරිපූරක හා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන වැඩිකර ගෙන තිබුණි. | නව අමාත්‍යාංශ සංශෝධනය අනුව අහෝසි වීම මත ප්‍රතිපාදන වෙන් කිරීම, රාජ්‍ය අමාත්‍යාවරයාට පඩිනඩි ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සළසාගැනීමට සිදුවීම නිසා ඉතිරිවීම් සිදු විය. | ප්‍රතිපාදන මනාලෙස කළමනාකරණය කළ යුතුය. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සේවය අතහැර ගොස් වසර 5 ට වඩා වැඩි කාලයක් ඉක්මවා ගොස් තිබූ කම්කරු අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් හා විදේශ රැකියා අංශයේ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.709,239 ක මුදල 2022 දෙසැම්බර් 31 දිනය වන විටත් අයකර ගත නොහැකිව පැවතුණි. | ණය මුදල් අයකරගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබූ කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීම හා ඇගයීම යන | | |

| | | | |
|---|---|---|---|
| | කාර්යය හා සේවක අර්ථසාධක අරමුදල පරිපාලනය කිරීම යන කාර්යය විධිමත් පරිදි ඉටුවී නොමැති බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය. | | |
| (i) | 2022 දෙසැම්බර් 31 දින වන විට සේවක අර්ථසාධක අරමුදලෙහි කේවල ගිණුම්වලට බැර නොවූ රු.282,726,669 ක්ද කම්කරු කොමසාරිස් දායක ගිණුමේ රු.57,174 ක්ද කම්කරු දෙපාර්තමේන්තුවේ උපකාර්යාලවල තැන්පත් ගිණුම්වල රඳවා තිබුණි. | අයිතිකරුගේ ගිණුම වෙත නිරවුල් කිරීමට අදාල කාර්යයන් කිරීමේදී නෛතික ලේඛණ විශාල වශයෙන් පරිශීලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මෙම අරමුදල් බොහෝ කාලයක සිට පැවත එනු ලබන ශේෂයන් බැවින් නිරවුල් කිරීමට යම් කාලයක් ගතවනු ඇත. නිවැරදි කිරීම් සිදු කිරීමෙන් අනතුරුව කේවල ගිණුම් වෙත මුදල් බැර කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නිලධාරීන් දැනුවත් කර තිබේ. | දායක මුදල් කේවල ගිණුම්වලට බැර කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) | 2022 වර්ෂය වන විටද පෞද්ගලික අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. | වර්තමානයෙහි පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යනු ලබන ආයතන බොහෝමයක් සේවක අර්ථසාධක අරමුදල් පනත ආරම්භ කිරීමට පෙර පැවති ආයතන වීම හේතුවෙන් පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදලේ අධීක්ෂණය කිරීම් යාන්ත්‍රණය වඩාත් ශක්තිමත් කිරීම සඳහා ඊට අදාල වන පනත් වගන්ති සංශෝධනය කල යුතු බවට හඳුනාගෙන ඇත. | පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | රැකියා නියුක්තිය සඳහා නියාමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් 2022 වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක නොවුණි. | මෙම ප්‍රතිපත්තිය සම්පාදනය කර අනුමත කර වසර 05 ක් ඉක්මගොස් ඇති බැවින් එය නැවත සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට අදාළ අංශ සම්බන්ධ කර දෙන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ද, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ (NHRDC) ද ඇතුළුව අදාළ ආයතන වෙතින් ඉල්ලීම් කර ඇති නමුත් මෙතෙක් යහපත් ප්‍රතිචාර ලැබී නැත. | මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය සකස් කළ යුතුය. |

## 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා නොමැති අවස්ථාවලදී විදේශාධාර උපයෝගී කරගැනීමට අවශ්‍ය වූ විට පරිපූරක ඇස්තමේන්තුවක් හෝ වීරමොං පටිපාටිය මගින් ප්‍රතිපාදන සලසාගත යුතු වුවත් 2022 වර්ෂයේදී ආසියානු ළදායිතා සංවිධානය මගින් ලබාදුන් ඇමරිකානු ඩොලර් 30,712 ක ආධාර මුදල සම්බන්ධව 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 621(2) ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. | 2022 වර්ෂයේදී ආසියානු ඵලදායිතා සංවිධානය මගින් ලබාදුන් විදේශ ආධාර සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු අතර, මේවන විට 2023 වර්ෂය සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයෙන් ලැබෙන විදේශ ආධාර සඳහා රුපියල් මිලියන 20 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වෙන්කර ගෙන ඇත. | භාණ්ඩාගාර උපදෙස් හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකල යුතුය. |
| (ආ) | ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී බලාපොරොත්තු නොමැති විදේශාධාර සම්බන්ධයෙන් අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් මුදල්රෙගුලාසි 621(6) ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මගේ අංක NPS/FMD/03/20 හා 2022.08.22 දිනැති ලිපිය මගින් මුදල් හා ආර්ථික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් වෙතින් මේ සම්බන්ධව උපදෙස් විමසූ අතර, 2023 වර්ෂය සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයෙන් ලැබෙන විදේශ ආධාර සඳහා රුපියල් මිලියන 20ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වෙන්කර ගෙන ඇත. | එම |
| (ඇ) | මුදල් රෙගුලාසි 625(3) හා රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 ප්‍රකාරව සෘජුව ලැබෙන මුදල් ප්‍රේෂණ භාණ්ඩාගාරයේ තැන්පත් කර, එම ප්‍රදාන උපයෝගී කර ගැනීම සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇති කල යුතු වුවත් ආසියානු ඵලදායිතා සංවිධානයෙන් අවස්ථා දෙකකදී ලද එකතු වටිනාකම වූ රු.3,975,914 ක ආධාර මුදල් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර වියදම් දරා තිබුණි. | ඉදිරියේදී ලැබෙන සියලු විදේශාධාර මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරන අතර, ව්‍යාපෘති වියදම ඉහත ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර ගත් වැය විෂය යටතේ ගිණුම් තැබීමට කටයුතු කරන බව සඳහන් කරමි. | එම |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය සතු රු.18,000,000 ක් වටිනා ටොයොටා ලෑන්ඩ් කෲෂර් ජීප් රථය 2018 ඔක්තෝම්බර් මස සිට මෙම වාර්තාවේ දිනය දක්වා භාවිතයට ගෙන නොතිබූ අතර, විදේශ රැකියා අංශයේ ඇති මෝටර් බයිසිකලය විගණන අවස්ථාව වන විටත් උපයෝජනය කර නොතිබුණි. | අමාත්‍යාංශය සතු ටොයෝටා ලෑන්ඩ් කෲෂර් ජීප් රථය අළුත්වැඩියා කිරීම ඵල රහිත බවත්, අපහරණය කිරීම සුදුසු බවත්, තාක්ෂණික නිලධාරින් සඳහන් කරන බැවින්, කමිටුවක් පත්කර මෙම ජීප් රථය අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිතය.<br>විදේශ රැකියා අංශයේ මෝටර් බයිසිකලය 2023 වර්ෂයේ දී මිල ගණන් කැඳවා එකී මිල කැඳවුම් අනුව අළුත්වැඩියා කටයුතු කිරීම සුදුසු ද යන්න තවදුරටත් තීරණය කරනු ලබයි. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව කළමණාකරණය කල යුතුය. |

### 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව විදේශ රැකියා අමාත්‍යාංශය සතු ඇඟිලි සළකුණු යන්ත්‍ර 2 ක් පැවති අතර 2022 වර්ෂයේ සමීක්ෂණ වාර්තා අනුව එක් යන්ත්‍රයක ඌණතාවයක් පැවතුණි. අස්ථානගත වී ඇති මෙම යන්ත්‍රය පිළිබඳව මුදල් රෙගුලාසි 103 සිට 109 ප්‍රකාරව කටයුතු කලයුතු වුවත් එසේ සිදුකර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල මේ පිළිබඳව අනාවරණය කර නොතිබුණි. | එක් යන්ත්‍රයක ඌනතාවය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු මේවන විට ආරම්භ කර තිබේ. එකී පරීක්ෂණ අවසන් වීමෙන් පසුව මුදල් රෙගුලාසි අනුව කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.5 අනාර්ථික ගණුදෙනු

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ ජාතික ඵලදායීතා සම්මාන තරඟාවලියේ ජයග්‍රාහකයන්ට පිරිනැමීම සඳහා සම්මාන කුසලාන 685 ක් සඳහා රු.4,512,123 ක ගෙවීමක් සිදුකර තිබූ අතර 2022 ජුනි 15 දින සම්මාන ගබඩාව වෙත භාර දී තිබුණි. සම්මාන භාරගෙන මසකට පසුව මේවා නිවැරදි පිරිවිතරයන්ගෙන් පවතින්නේද යන්න වාර්තාවක් කැඳවා තිබූ අතර, 2022 සැප්තැම්බර් 21 දින NPS/PR/06/001 ලිපිය පරිදි ගබඩාවට ලබාදුන් සම්මාන ඒකක 33 ක් හැර ඉතිරි ඒවා දෝෂ සහිත බව වාර්තා කර තිබුණි. එසේ තිබියදී මෙම සම්මාන කුසලාන ජයග්‍රාහකයන්ට පිරිනැමීමට කටයුතු කර තිබුණි. | පවත්නා තත්ත්වය මත නිවැරදි කිරීමේ අපහසුතාවය සළකා බලා යම් සුළු අපගමනයක් පැවතිය ද සම්මාන භාවිතයට ගන්නා බැවින් සියයට 1 ක දඩයක් අයකර ජාතික ඵලදායිතා සම්මාන උළෙල පැවැත්වීම සිදු කරන ලදි. | වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අන්දමින් ගණුදෙනු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී ආරම්භක මූලික වියදම රු.1,465,200 ක් දරා මාසිකව රු.25,000 බැගින් නඩත්තු වියදම් රු.1,700,000 ක්ද, අනෙකුත් වියදම් සඳහා රු.133,800 ක් වැය දරා 2022 දෙසැම්බර් 31 වන විට එකතු පිරිවැය රු.4,299,000 ක් වූ e-breeze ව්‍යාපෘතිය ඵලදායීතා සම්මාන උළෙලේ කටයුතු සඳහා භාවිතා කර ඇති නමුත්, අනෙකුත් අපේක්ෂිත කාර්යයන් වූ උත්සව කළමණාකරණය හා අධ්‍යයන කළමණාකරණය නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි. | තවදුරටත් මෙම පද්ධතිය භාවිතයෙන් තොරව පවත්වා ගෙන යාම වෙනුවට නිසි අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා පද්ධතියේ පෙර පැවති දත්ත සියල්ල උපස්ථ (backup) කොට පද්ධතිය නව අනුවාදයක් (version) ලෙස ස්ථාපනය කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව, e-breeze පද්ධතිය මෙතෙක් පැවති ඌන උපයෝජනය තත්ත්වයෙන් තොරව වඩා නිවැරදිව භාවිතාවක් හරහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ උපරිම රාජකාරි කාර්යක්ෂමතාව වෙනුවෙන් යොදා ගැනීමට බලාපොරොත්තු වන බවත් වැඩි දුරටත් දන්වා සිටිමි. | පද්ධතිය කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරිමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දින වන විට ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති ඵලදායිතා සංවර්ධන නිලධාරීන් 639 ක් සඳහා නිසි පරිදි කාර්යභාරය පැවරුමක් හෝ ප්‍රධාන කාර්යාලයෙන් නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. | වැටුප් වර්ධක ලබාදීමට පෙර ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ පරිගණක ඉදිරිපත් කිරීමක් පරීක්ෂා කෙරේ. මාසික ප්‍රගති වාර්තා පරීක්ෂා කරනු ලැබේ. කාර්යයමණ්ඩල සමාලෝචන වැඩපිළිවෙලක් සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. | නිලධාරීන් අධීක්ෂණය හා කාර්යය පැවරුම් කල යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී කම්කරු අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි වේ. | පුරප්පාඩු පිරවීමට අදාළව අමාත්‍යාංශය වෙත සිදු කළ හැකි කාර්යය, එනම් අදාළ ආයතන වෙත පුරප්පාඩු පුරවන ලෙස දැනුම් දීම සිදු කර ඇත. ඒ අනුව, උපාධිධාරීන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් මෙම අමාත්‍යාංශය වෙත ලබා දී ඇති හෙයින් ද්විතීක මට්ටමේ පුරප්පාඩු පුරවා ඇත.<br>බඳවා ගැනීම් සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව පුරප්පාඩු පිරවීම අත්හිටුවා ඇති හෙයින් බහුකාර්යය සංවර්ධන කාර්යසාධක බලකාය වෙතින් සේවකයින් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. | පරිපාලන ගැටලු නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය. |

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ---------- | ------- | ------- | ----- |
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 449 | 298 | 151 |
| (ii) තෘතියික මට්ටම | 908 | 665 | 243 |
| (iii) ද්විතියික මට්ටම | 5,049 | 4,800 | 249 |
| (iv) ප්‍රාථමික මට්ටම | 858 | 704 | 154 |
| එකතුව | 7,264 | 6,467 | 797 |